ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපනවේදී (ස්වාභාවික විද්‍යා) උපාධිය - 5 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2008

විෂයමාලා න්‍යාය සහ පරිචය- **ESU 3115**

කාලය පැය තුනයි.

---

දිනය - 2008.09.02 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ ප්‍රශ්න සියල්ලටමද දෙවන කොටසේ ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.

## පළමුවන කොටස

01. විෂයමාලාව පිළිබඳව ඔබේ වචනවලින් නිර්වචනයක් දක්වන්න.

02. විෂයමාලාවේ ප්‍රධාන අවයවයන් හතර (04) නම් කරන්න.

03. විෂයමාලාව සැලසුම් කිරීමේදී පළමුවෙන්ම පරමාර්ථ හා අරමුණු තීරණය කිරීම අවශ්‍ය වන්නේ කුමක් නිසාදැයි හේතු තුන (03) ක් දක්වන්න.

04. විෂයමාලා සැලසුම්කරණයේදී හා සංවර්ධනයේදී සම්බන්ධ කර ගත යුතු යැයි ඔබ අපේක්ෂා කරන පුද්ගලයන් පහ (05) ක් නම් කරන්න.

05. ස්කිල්බෙක්ගේ විෂයමාලා ආකෘතියේ ඉතාමත් වැදගත් ලක්ෂණ විස්තර කරන්න.

06. විෂයමාලාව ඇගයීමේ අරමුණු තුන (03) ක් ලියා දක්වන්න.

07. "පාසල් පාදක ඇගයීම වර්තමානයේ පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වේ. එය අඛණ්ඩ ඇගයීම ලෙස කාණ්ඩ කළ හැකිය." ඉහත ප්‍රකාශය සනාථ කිරීම සඳහා හේතු දෙක (02) ක් ඉදිරිපත් කරන්න.

08. පහත සඳහන් නිපුණතා දෙකෙන් එකක් (01) පැහැදිලි කරන්න.

    **(a)** සන්නිවේදනය පිළිබඳ නිපුණතාව
    **(b)** ඉගෙනුමට ඉගෙනුම පිළිබඳ නිපුණතාව

(ලකුණු 5 x 8 = 40)

## දෙවන කොටස

09. "පාසල් විෂයමාලාව තුළ (i) විධිමත් විෂයමාලාව (ii) විෂය සමගාමී ක්‍රියාකාරකම් (iii) සැඟවුණු විෂයමාලාව යනුවෙන් පුළුල් ක්ෂේත්‍ර තුනක් දක්නට ලැබේ." ශිෂ්‍යයාගේ පූර්ණ සංවර්ධනය සඳහා මෙම අංශවලින් ලැබෙන දායකත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 20)

10. (i) ටයිලර්ගේ ආකෘතියේ ඇති දුර්වලතා හඳුනාගෙන ඒවා නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) මෙම දුර්වලතා මඟ හැරවීම සඳහා වීලර්ගේ විෂයමාලා ආකෘතිය යොදා ගත හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 06)

(iii) ශ්‍රී ලංකාවේ වර්තමාන ද්විතීයික පාසල් විෂයමාලාව සංවර්ධනය සඳහා එම ආකෘති දෙක ආදේශ කළ හැකි අයුරු සාකච්ඡා කරන්න. (ලකුණු 08)

11. (i) ඉගෙනුම් අත්දැකීම් යන සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 06)

(ii) ඉගෙනුම් අත්දැකීම් හා විෂයමාලා සංදර්භය අතර සම්බන්ධතාවය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(iii) විෂයමාලා අරමුණු තුළින් ලබාදෙන ඉගෙනුම් අත්දැකීම්වලට බලපාන සාධක අතරින් (5) ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

12. ශ්‍රී ලංකාවේ පාසල් විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් ආයතනයන්හි භූමිකාවන් විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

i. ජාතික අධ්‍යාපන ආයතනය
ii. අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුව
iii. කලාප අධ්‍යාපන කාර්යාල (ලකුණු 20)

13. විෂයමාලාව සැලසුම්කරණයේදී සලකා බැලිය යුතු මනෝ විද්‍යාත්මක හෝ සමාජ විද්‍යාත්මක සාධක අවම වශයෙන් හතර (04) ක් වත් විවේචනාත්මකව පරීක්ෂා කරන්න. (ලකුණු 20)

UNIVERSITY OF SRI LANKA LIBRARY

14. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් (02) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) 1972 ශ්‍රී ලංකාවේ විෂයමාලාවේ වැදගත් ලක්ෂණ
(ii) 2007 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද පාසල් පාදක විෂයමාලාවේ වැදගත් ලක්ෂණ
(iii) ශ්‍රී ලංකාවේ පාසල් මට්ටමේ විෂයමාලා කළමනාකරණය
(iv) විෂයමාලා සංදර්භයේ සිරස් හා තිරස් සංවිධානය

(ලකුණු 10 x 2 = 20)

- හිමිකම් ඇවිරිණි. -